ජාතක කථා - 29

# හිතා මතා
# ගෙතූ කතා



(C) Sumitha Publishers

කියා දෙන්නේ

**කුසුම් දිසානායක**

චිත්‍ර ඇන්දේ

**ජානක ඉලුක්කුඹුර**

බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජතුමා
රජ කරමින් සිටි කාලයේ එක් සිංහ ධේනුවක් හා
ගව දෙනක් මිත්‍ර ව වාසය කළහ.



(C) Sumitha Publishers



(C) Sumitha Publishers

සිංහ ධේනුවට සිංහ පැටියෙක් ද
ගව දෙනට ගව පැටියෙක් ද වූහ.
මව්වරුන්ගේ හිත මිත්‍රකම් නිසා
මේ පැටව් දෙන්නා ද කුඩා කල සිට
එකට සෙල්ලම් කළහ.
තරුණ වියට පැමිණි විට ද
දෙදෙනාගේ මිත්‍රකම දිගට ම පැවතිණ.
ගවයා තණකොළ කන අතර සිංහයා
ගොදුරක් සොයා කා දෙදෙනා එක තැන නිදා ගනිති.
දෙදෙනා ම එක් ව වනාන්තරයේ සැරිසරති.



(C) Sumitha Publishers



(C) Sumitha Publishers

දිනක් එක් වැද්දෙක් වනාන්තරයට පැමිණියේය.
ගවයෙකු හා සිංහයෙකු එකට ඇවිදිනු ඔහු දුටුවේය.
දෙදෙනා එක් ව විවේකී ව ලැග සිටිනු දුටු විට
ඔහු පුදුමයට පත් විය.
'මේක නම් මහා පුදුමයක්.
රජතුමාට කියන්ට ඕනෑ' යයි ඔහු සිතීය.
රජතුමාට දිය යුතු තෑගි වනාන්තරයෙන් සපයා ගත් වැද්දා
රජතුමා බැහැදැකීමට ගියේය.